# 6 ශ්‍රේණිය - 03 වන වාරය

# නර්තනය හදාරන සිසුන්ට ඉගෙනුම් අත්වැලක්




අධ්‍යාපන අමාත්‍යාංශය

සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව

උපදේශණය - අධ්‍යාපන ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය

- රාජ්‍ය ලේකම්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යාංශය

මග පෙන්වීම - එච්.යූ. ප්‍රේමතිලක මයා (අතිරේක ලේකම්, අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන)

- නීල් ගුණදාස මයා (අතිරේක ලේකම්, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ)

සම්බන්ධීකරණය - ආචාර්ය නිශාද් හඳුන්පතිරණ මයා (අධ්‍යාපන අධ්‍යක්ෂ වැ.බ.)

නියාමනය - මහීපාල උක්වත්ත මයා (නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ - සෞන්දර්ය අධ්‍යාපන ශාඛාව)

**පාඨම් සැකසීම -**

- ආචාර්ය පාලිකා සමන්ති මිය - ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - විදේශ නර්තන අධ්‍යයන අංශය සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය -කොළඹ
- මරීනා ද සොයිසා මිය - කථිකාචාර්ය - සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව ජාතික අධ්‍යාපන ආයතනය - මහරගම
- දීපමාල් විජේතුංග මයා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - අනුරාධපුරය
- සුගත් කරුණානායක මයා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - කලාප අධ්‍යාපන කාර්යාලය - ගම්පහ
- දුමින්ද සේනානායක මයා - සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ - කලාප අධ්‍යාපන කාර්යාලය - හෝමාගම
- හිමාලි ගමගේ මිය - ගුරු උපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය -මහනුවර
- කේ .එල් .ඒ .ධර්මලතා මිය - ගුරු උපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය දෙහිඕවිට
- අනෝමා කහදවආරච්චි මිය - ගුරු උපදේශක - කලාප අධ්‍යාපන කාර්යාලය කැළණිය

6 ශ්‍රේණිය නර්තනයට අදාලව, තෙවන වාරයට නියමිත, "නර්තන සම්ප්‍රදායට ප්‍රවර්ධනයට දායක වූවෝ" පාඩමට අදාලව විෂයය කරුණු මෙහි ඇතුළත් කර ඇත .

හොදින් කියවා, අවබෝධ කරගෙන ඔබගේ ඉගෙනුම වඩාත් සාර්ථක කරගන්න

## දේශීය නර්තන සම්ප්‍රදායයන් ප්‍රවර්ධනයට දායකවූවෝ

- **දේශීය නර්තන සම්ප්‍රදායන් ප්‍රවර්ධනයට දායකත්වය**

ශ්‍රී ලංකාව කුඩා රටක් වුවද, දේශිය නර්තන සම්ප්‍රදායන් වන උඩරට නර්තන සම්ප්‍රදායය,පහතරට නර්තන සම්ප්‍රදායය සහ සබරගමු නර්තන සම්ප්‍රදායය යන නර්තන සම්ප්‍රදායන් ත්‍රිත්වයෙන් සමන්විත රටකි.මෙම නර්තන සම්ප්‍රදායන් ශාන්ති කර්ම මත පදනම් වී ඇත. එම ශාන්ති කර්මවල ගැබ් වූ සාම්ප්‍රදායික නර්තන අංග ඒ අයුරින් ආරක්ෂා කර ගනිමින් හා සංවර්ධනය කරමින් ඒවා ඉදිරි පරම්පරාවට දායාද කිරීමට පැරණි ප්‍රවීණ නර්තන ශිල්පීන්ඉමහත් වෙහෙසක් දරා ඇත.

- නිත්තෙවෙල ගුණයා මහතා

උඩරට නර්තන කලාවේ පුරෝගාමිකයෙකු වූ මෙතුමා 1906 දී උපත ලැබීය. නිත්තෙවෙල ගුණයා ගුරුතුමා උඩරට නර්තනය ප්‍රභූ සමාජයේ අවධානයට ලක් නොවී තිබූ යුගයක තමා සතු කුසලතා ප්‍රදර්ශනය කරමින් එය සමාජයේ වටිනා කලාවක් බවට පත්කිරීමට කටයුතු කළේය.සාම්ප්‍රදායික උඩරට නර්තන කලාව ප්‍රාසාංගික වේදිකාවට සුදුසු ලෙස සකස් කිරීමට පුරෝගාමීයාද විය. එසේම ජාත්‍යන්තර තලයට උඩරට නර්තන කලාව ගෙන යාමට කටයුතු කල අතර, නිර්මාණකරණයට උරදෙමින් වන්නම් 18 ට අමතරව සමනළ වන්නමද නිර්මාණය කරන ලදී. මේ ආකාරයට ඉටුකළ මාහැඟි සේවය අගයමින් 1950 වසරේදී මෙතුමාගේ රුව ඇතුළත් තැපැල් මුද්දරයක්ද නිකුත් කර ඇත.






- එන්.ඒ. සිරිබෝහාමි මහතා

සබරගමු නර්තන සම්ප්‍රදායේ ප්‍රවීණයෙකි. සබරගමුවේ පැල්මඩුල්ල,සන්නස්ගම ජීවත් වූ මෙතුමා සබරගමු මඩු සම්ප්‍රදායයේ දවුල් වාදනයට හා ගායනයට අති දක්ෂ ඇදුරුතුමෙකි. සබරගමු නර්තනය ඉගැන්වීමට කලායතනයක් පවත්වා ගෙන ගියේය.එමගින් සබරගමු නර්තන සම්ප්‍රදාය පිළිබඳ මනා කුසලතා ඇති දරු පරපුරක් බිහි කිරීම අගය කළ යුතුය. දේශපාලනික බලවතුන්ගේ ආධාර ඇතිව වියැකී යන සබරගමු නර්තන සම්ප්‍රදාය සුරැකිමටත්, පාසල් පද්ධතියට එම විෂයය ඇතුළත් කිරීමටත්, උත්සාහ දැරීම ප්‍රශංසනීය. ශාන්ති කර්ම වලට සීමා වූ මෙම සම්ප්‍රදාය කළඑලියට ගෙන ඒමටත්, එම විෂය රසවින්දනාත්මක විෂයයක් බවට පත් කිරීමටත්, උගතුන්ගේ සහ විචාරකයන්ගේ අවධානය යොමුකර ගැනීමටත්, කටයුතු කිරීම ඉතා වටිනේය.
මෙතුමා නර්තනයට මෙන්ම දවුල් වාදනයට ද අති දක්ෂ මෙන්ම ශාන්ති කර්ම පිලිබඳ හසළ දැනුමක් ඇති ප්‍රවීණයෙකි.

රජයේ නැටුම් හා මුද්‍රා නාට්‍ය විද්‍යාලයේ බාහිර කථිකාචාර්ය වරයෙකු ලෙස කටයුතු කළ මෙතුමා ප්‍රාසංගික වේදිකාවේ අත්‍යාවශ්‍ය නර්තන අංගයක් ලෙස සබරගමු නර්තනයත් තිබිය යුතු බවට අදහස් පළකරමින් ඒවා වේදිකාවට ගෙන ඒමට කටයුතු කිරීම පිළිබඳව ප්‍රශංසාව ද හිමි විය යුතුය.

- එච්. එස්. සව්රිස් සිල්වා මහතා

පහතරට නර්තන සම්ප්‍රදායේ ප්‍රවීණයෙකු වූ සුවද හැන්නැදිගේ සව්රිස් සිල්වා මහතාගේ උපන් ගම තංගල්ලය. 1896 වර්ෂයේ උපත ලද මෙතුමා සිංහල, පාලි, සංස්කෘත භාෂා පිලිබඳව හසළ දැනුමක් ඇත්තෙකි. පහතරට නර්තන කලාව ප්‍රචලිත කිරීමට, ප්‍රසාංගික කලාවක් ලෙස නූතන වේදිකාවට ගෙන ඒමටත්, කටයුතු කළ මෙතුමා රජයේ කලායතනයෙහි බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස ද කටයුතු කළේය. 1948 දී ජයන්ති කලායතනය බිහිකරමින් සිසුන්ට සිප් සතර ලබා දුන්නේය. 1958 දෙවන එළිසබත් රැජින ලක්දිවට පැමිණි අවස්ථාවේ පැවැත් වූ ප්‍රසංගයේ ප්‍රධාන නර්තන ශිල්පියා ද වූයේ මෙතුමාය.




පහතරට නර්තන කලාවට මහත්සේ කැමත්තක්ම දැක්වූ මෙතුමා වසර 84 ක් පමණ ආයු වළඳා 1982 දී අභාවප්‍රාප්ත විය. මෙතුමාගේ නර්තන රංග වස්ත්‍රාභරණ කට්ටල හා අනෙකුත් උපකරණ දැනට ජාතික කෞතුකාගාරයේ මහජන ප්‍රදර්ශනය සඳහා තැන්පත් කොට ඇත.

මෙතුමාගේ කෘති

1965 -පහතරට නැටුම් (පහතරට නැටුම් පිලිබඳ ප්‍රථම සිංහල ග්‍රන්ථය)
1971- සූනියම් ශාන්තිය

පැවරුම්

පහත සඳහන් වගුවෙහි A හා B තීරු ගලපන්න

| A | B |
|---|---|
| එස්. එච්. සව්රිස් සිල්වා මහතා | නිත්තේවෙල ගුණයා මහතා |
| 1906 උපත ලැබීය. | සූනියම් ශාන්තිය ග්‍රන්ථය |
| එන්.ඒ.සිරිබෝහාමි | සබරගමු නර්තන ශිල්පියෙකි |
| ජාතික කෞතුකාගාරයේ තැන්පත් කර ඇත. | එන්.ඒ.සිරිබෝහාමි |
| දවුල් වාදන ශිල්පියෙකි | තැපැල් මුද්දරයක රූපය ඇත. |
| නිත්තෙවෙල ගුණයා මහතා | එස්. එච්. සව්රිස් සිල්වා මහතාගේ රංග වස්ත්‍ර |

6 ශ්‍රේණිය  නර්තන විෂයට අදාලව ,තෙවන වාරයට නියමිත“ , නත්තල් උත්සවය”
පාඩමට අදාලව විෂයය කරුණු  මෙහි ඇතුළත් කර ඇත . හොදින්  කියවා ,අවබෝධ කරගෙන
ඔබගේ ඉගෙනුම වඩාත් සාර්ථක කරගන්න.

## නත්තල් උත්සවය



නත්තල යන වචනයේ අර්ථය උපත යන්නයි. ඒ අනුව නත්තල් උත්සවය කිතු උපත සිහිපත් කරන්නකි. කිතුනු බැතිමතුන්ගේ ගෞරවාන්විත ශාස්තෘවරයාණන් වූ ද, සාමයේ පණිවිඩය ගෙන ලොවට පහළ වූ දෙවියන් වහන්සේගේ පුත්‍රයාණන් වූ ද ජේජු ස්වාමි දරුවාණන්ගේ හෙවත් ක්‍රිස්තුස් වහන්සේගේ උපත නිමිතිකොට ගෙන නත්තල් උත්සවය ලෝකයේ බොහෝ රටවල මෙන් ම ශ්‍රී ලංකාවේ ද ඉතා උත්කර්ෂවත් අන්දමින් දෙසැම්බර් මස 25 වන දින පවත්වනු ලබයි. මෙය ආගමික උත්සවයක් ලෙස පැවැත්වීම ප්‍රධාන අරමුණ වුව ද සංස්කෘතිමය හා සමාජීය වශයෙන් ද වැදගත් වන්නා වූ උත්සවයකි.
ක්‍රිස්තුස් වහන්සේ ජේසුතුමා නමින් ද හඳුන්වන අතර එතුමාගේ පියා ජුසේතුමා ය. ජේසුතුමා උපත ලැබුවේ බෙත්ලෙහෙමේ පුංචි  ගව මඩුවක දී ය.

### නත්තල් උත්සවය හා සබැඳි ආගමික වත්පිළිවෙත්

කතෝලික බැතිමතුන්ගේ ආගමික උත්සවයක් ලෙස සලකනු ලබන නත්තල දෙසැම්බර් මස 25 දින මධ්‍යම රාත්‍රී 12ට සමරනු ලබයි. මෙදින ඉතාම අලංකාර ඇඳුම් පැළඳුම්වලින් සැරසී දෙව් මැදුරු කරා ගොස් දේව මෙහෙයට සහභාගි වී ජේසුතුමන්ගේ උත්පත්තිය සමරමින්, වන්දනාමාන කිරීම, යාච්ඤා කිරීම හා පූජකතුමන්ලාගේ දේශනවලට සවන් දීම යනාදිය සිදු කරනු ලැබේ.

මෙදින එකිනෙකාට සුබ පතමින් තෑගි බෝග ලබා දී චාරිත්‍ර ඉටු කිරීමෙන් ද, කතෝලික බැතිමතුන්ගේ ශාස්තෘවරයාණන් වන ජේසුතුමන් පැසසීම, වන්දනාමාන කිරීම, යාච්ඤා කිරීම, පාප් වහන්සේ ඇතුළු පූජකවරුන්ගේ දේශනාවලට සවන්දීම ආදිය දැකිය හැකිය.

- නත්තල් උත්සවය හා සබැඳි ආගමික වත් පිළිවෙත්

නත්තල් උත්සව සමයේ කිතුනු බැතිමත්හු තම නිවෙස් හා අවට පරිසරය තුළ නත්තල් ගස් හා ගව ලෙන් සකස් කර විවිධ සැරසිලිවලින් අලංකාර කරති.








එමෙන් ම නත්තල් ගී ගායනය නත්තල් උත්සවයේ දී සුවිශේෂී වූවකි. කැරොල් ගී ලෙස හඳුන්වන මෙම ගීත ලංකාවේ ආරම්භ වී ඇත්තේ පෘතුග්‍රීසි යුගයේදී බව සඳහන් වන අතර, මෙම ගීත සාහිත්‍යය ආරම්භ කිරීමට කටයුතු කර ඇත්තේ ඉන්දියානු ජාතික " ජාකොමේ ගොන්සාල්වේස් " පියතුමා ය.

උදා : කැරොල් ගීත

| | | |
|---|---|---|
| රෑ තරු බබළනවා ....... | - | මල් පිපිලා වාගේ ...... |
| එළියෙන් නැහැවෙනවා..... | - | මල් වැහැලා වාගේ ...... |
| රැව් පිළිරැව් දෙනවා ...... | - | ගීත නාද වාගේ ........ |
| බිළිඳෙකු හිනැහෙනවා .... | - | මුහුදක රැළි වාගේ ...... |

නත්තලේ තවත් සුවිශේෂී චරිතයක් වන්නේ නත්තල් සීයා ය. සුවිශේෂ ඇඳුමකින් සැරසී සිටින මොහු කුඩා දරුවන්ට හා ළමා ළපටින්ට තෑගි බෝග දී සතුටු කිරීම සිදු කරයි. මෙය තුර්කියේ විසූ ශාන්ත නිකලස් පියතුමා විසින් ආරම්භ කළ බව සඳහන් වේ.



කාර්ය පත්‍රිකාව

1. නත්තල් උත්සවය පැවැත්වීමේ අරමුණු දෙකක් ලියන්න.
2. නත්තල් උත්සවය හා බැඳි චාරිත්‍ර හා සැරසිලි අංග මොනවාද?
3. නත්තල් සැරසිල්ලක් ඉතා හොඳින් නිරීක්ෂණය කරන්න.
4. නත්තල් ආසිරි පතක් නිර්මාණය කරන්න.
5. කැරොල් ගීතයක් ගායනා කරන්න.
6. නත්තල් සමයේ ගුවන් විදුලියෙන් හෝ රූපවාහිණියෙන් බොහෝ අවස්ථාවලදී ඒ හා සම්බන්ධ ගිත ශ්‍රවණය කිරීමට ලැබෙන අතර ඒවා අර්ථවත්ව රසවිඳින්න.
7. මෙවර නත්තලට නත්තල් සැරසිල්ලක් සකස් කරන්න.

**<u>6 ශ්‍රේණිය නර්තනයට අදාලව, තෙවන වාරයට නියමිත, "මහ සමන් දේවාල පෙරහැර" පාඩමට අදාලව විෂයය කරුණු මෙහි ඇතුළත් කර ඇත . හොදින් කියවා, අවබෝධ කරගෙන ඔබගේ ඉගෙනුම වඩාත් සාර්ථක කරගන්න</u>**

## <u>මහ සමන් දේවාල පෙරහැර</u>

රත්නපුර නගරයට ආසන්නයේ පිහිටි දේවාලේගම නම් ග්‍රාමයේ මහ සමන් දේවාලය පිහිටා ඇත. සුමන සමන් දෙවියන් වෙනුවෙන් ඉදිවූ මෙම දෙවොල දඹදෙණි යුගයේ දෙවන පැරකුම්බා රජුගේ කාලයේ ඉදිවූවකි. මෙම දේවාලය මුලික කර ගනිමින් සැම වසරකම ඇසළ මාසයේ උත්කර්ශවත් අන්දමින් ඇසළ මහා පෙරහැර පවත්වනු ලබයි.සමන් දේවාලයයේ පහත චිත්‍රය දෙස බැලීමේදී ඒ පිලිබදව ඔබට ගෞරවයක්, බැති සිතිවිල්ලක් පහල වනු ඇත.

මේ අපේ උරුමයකි. සමන් දෙවියන්ගේ වහන්සේගේ අති පුජනීය ස්ථානයයි. සබරගමු මහ දෙවොලයි.



❖ සමන් දේවාල පෙරහැර හා බැඳි චාරිත්‍ර

- මෙම චාරිත්‍ර ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදා දැක්වේ.

1. දිනපතා පවත්වන චාරිත්‍ර
2. සතිපතා පවත්වන චාරිත්‍ර
3. වාර්ෂිකව පවත්වන චාරිත්‍ර

- දිනපතා පවත්වන චාරිත්‍ර
    1. අලුයම් ධූරයේ තේවාව
    2. හිල්ම තේවාව
    3. මහ තේවාව (දහවල්)
    4. බොලපැන් තේවාව
    5. හැන්දෑදූරයේ තේවාව
    6. මහ තේවාව (රාත්‍රී කාලය)

- **සතිපතා පවත්වන චාරිත්‍ර**
    1. බදාදා සහ සෙනසුරාදා පවත්වන පූජා

- **වාර්ෂික පූජා චාරිත්‍ර**
    1. අලුත් සහල් මංගල්‍යය
    2. අලුත් අවුරුදු උත්සවය
    3. ඉල්මහ කාර්තික උත්සවය
    4. ඇසළ පෙරහැර උත්සවය

## සමන් දේවාල පෙරහැර හා බැඳි නර්තන වාදන අවස්ථා

- මෙම ඇසල උත්සවය පෙරහැර තුනකින් සමන්විත වේ.
    1. කුඹල් පෙරහැර
    2. දෙවේලේ පෙරහැර
    3. රන්දෝලි පෙරහැර යනුවෙනි.

කුඹල් පෙරහැර දින 5 ක් තුළ පවත්වනු ලබයි. වළං කද ගත් අතවැසියකු සමග කුඹලා පෙරහැර ඉදිරියෙන් ගමන් කරයි.

දෙවේලේ හෙවත් වීදි පෙරහැර ද දින 5 ක් පුරා පවත්වයි. මහ දේවාලයේ ආභරණ හා පත්තිනි හළඹ මෙම පෙරහැරේ වැඩම කරවයි.

තුන්වන දින තුල රන්දෝලි පෙරහැර මහත් උත්කර්ශවත් අන්දමින් පවත්වනු ලබයි. මෙසේ දින 15 ක් පුරා ඇසළ පෙරහැර පැවැත්වේ.

- **පෙරහැර පැවැත්වීම සඳහා**
    1. නැකත් සකස් කිරිම
    2. කප් සිටුවීම
    3. නානාමුර මංගල්‍යය වැනි මූලික චාරිත්‍ර පළමුවෙන් සිදු කරනු ලැබේ.

පිරිත් සජ්ඣායනා කිරීමෙන් පෙරහැර චාරිත්‍ර ආරම්භ කරනු ලැබේ. ඉන් පසුව පෙරහැරට සම්බන්ධ නර්තන ශිල්පීන් හා සියලු දෙනාම පෙරහැරට සූදානම් වෙති. පෙරහැර පිටත්වීම සඳහා අණදෙන **වෙඩිල්ල** පත්තු කරයි.

පෙරහැරේ මුලින්ම ගමන් කරන්නෝ කසකරුවෝ හා ගිනිබෝල කරුවෝය. ඉන්පසු පුරාණ චාරිත්‍රයක් වූ මහබඹා රැගෙන යාම ( මහබඹා කෝලම වර්තමානයේ ද දැක ගත

හැකිය.) මෙය සමන් දේවාල පෙරහැරේ දක්නට ලැබෙන විශේෂ අංගයකි. මහබඹා කෝලම පෙරහැරේ මුලින්ම ගමන් කරවීමෙන්, සිදුවන සියළු විපත් දුරු වන බවට විශ්වාසයක් ජනතාව තුළ ගොඩනැගී ඇත.

ඉන් පසු පත්තිනි පෙරහැරේ කාන්තාවෝ සුදු වස්ත්‍ර ඇද දෝලාව අසලින් ගමන් කරති.

සමන් දේවාල පෙරහැරේ සමන් දේව ආභරණ, දෝලාව හා කුමාර රථය ආදිය රැගෙන යනු ලැබේ. එය බිසෝ පෙරහැර කුමාර පෙරහැර, සමන් දෙවි රජ පෙරහැර යනුවෙන් හදුන්වනු ලැබේ. මෙහිදී ද හේවිසි වාදකයෝ සහ සබරගමු නර්තන ශිල්පීහු සහභාගී වෙති. මෙසේ හේවිසි වාදන කණ්ඩායම් පෙරටුව සබරගමු නර්තන ඇඳුම් කට්ටලයෙන් සැරසුණු නර්තන කණ්ඩායම් ද, සමන් දේවාල පෙරහැරට සහභාගී වන අතර, උඩරට වෙස් නැටුම්, පන්තේරු හා උඩැක්කි නර්තන කණ්ඩායම් මෙන්ම විවිධ ජන නැටුම් ආදිය ද දැක ගත හැකිය. එසේ ම පහතරට තෙල්මෙ, දෙවොල්, වඩිග පටුන ආදී නර්තන හා විශේෂයෙන් පෙරහැර අවසානයේ නිල ඇඳුමින් සැරසුණු නිළධාරී මණ්ඩලය ගමන් කිරීම පුරාණයේ සිට පැවත එන සිරිතකි.

රන්දෝලි පෙරහැර අවසාන දිනයට පසු දින, දහවල් දිය කැපීමේ චාරිත්‍රය සිදු කරනු ලැබේ. පෙරහැර උත්සවය සම්පූර්ණයෙන්ම නිමා වන්නේ ගරා යකුම නැටීමෙනි.

තවත් වැදගත් චාරිත්‍රයකි දිග්ගෙයි නැටුම.මේ සදහා සහභාගී වී ඇති කන්‍යාවන් හදුන්වා ඇත්තේ මාණික්‍යා මහගෙලා නමිනි. මෙය ලාස්‍ය නර්තනයකි. එමෙන්ම ගායනාවන්ට අනුව නටනු ලබන නර්තනයක් ලෙස ද දැක්විය හැකිය.

මෙසේ බලන කල ශ්‍රී ලංකාවේ පැවැත්වෙන පෙරහැර අතර සමන් දේවාල පෙරහැරට සුවිශේෂී තැනක් හිමිවේ.